// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2066/7 – 2018 අප්‍රේල් 09 වැනි සඳුදා – 2018.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2017/209.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඒ. ටී. ජී. සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

1A – G 27444 – 12 (2018/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2017/209.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10. (සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඒ. ටී. ජී. සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්, ආයෝජන ප්‍රවර්ධන කලාපය, කටුනායක.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ඒ. ටී. ජී. සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට වසර 25ක් පිරීම නිමිත්තෙන් ලබා දුන් තිළිණයන්, එය ලබා ගැනීමට සුදුසුකම් සපුරා තිබියදීත් පහත සඳහන් සේවකයින්ට ලබා නොදීම යුක්ති සහගත ද යන්න හා එසේ යුක්ති සහගත නොවේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන මොනවා ද? යන්න පිළිබඳව වේ.''

01. ඩබ්ලිව්. කැලුම් ජේමතුංග
02. බී. කේ. ජයනාත් පෙරේරා
03. සී. ඩබ්ලිව්. ආර්. ඉන්දික වඩුගේ
04. එච්. ආර්. කේ. ගුණරත්න
05. ඩබ්ලිව්. ඩී. ආර්. ශ්‍රීමාල්
06. එල්. පී. සුසන්ත

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මාර්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 – 811

---

මගේ අංකය: IR/COM/04/2016/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. නිමල් මයා, ආර්. ජී. 4, සොයිසාපුර, මොරටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බෙලිඅත්ත, ගැටමාන්න පාර, කෝවිල්වත්ත, අංක 16/6, නන්දසේන බැදිගම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. නිමල් මයා, ආර්. ජී. 4, සොයිසා පුර, මොරටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''1981 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පරිගණක ක්‍රියාකරුවකු ලෙස සේවයට බැඳී, දැනට ක්‍රම සහකාර ලෙස සේවය කරන එච්. කේ. නිමල් මයාට 1996 වර්ෂයේ සිට ක්‍රම විග්‍රාහක තනතුර හා හිඟ වැටුප් ලබා නොදීමෙන් හා 2006.01.01 දින සිට ඉටු කරනු ලැබූ දත්ත සුපරීක්ෂක කටයුතු වෙනුවෙන් එම තනතුරේ වැඩ බැලීමේ දීමනාව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම්, ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද ? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මාර්තු මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04 – 812

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.